**ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය - 2013**

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 18 දරන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු.1,455,000 ක් වූ අධිකාරිය සතු ජීප් රථයක් ප්‍රත්‍යාගණනය කර එහි අගය ගිණුම්ගත කර නොතිබූ අතර මෙම මෝටර් රථය බාහිර පාර්ශවයකගේ ප්‍රයෝජනය සඳහා යොදාගෙන තිබූ බව විගණනයට වාර්තා කර තිබුණි

(ආ) සමාලෝචිත වර්ෂයේ ගලගාව තේ කම්හල සතු යන්ත්‍රෝපකරණ ඉවත් කිරීමෙන් ලද රු.275,000 ක ලාභය සහ වෙනත් වත්කම් ඉවත් කිරීමෙන් වූ රු.7,632,383 ක පාඩුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වනවා වෙනුවට ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

#### 2.2.2 ලැබිය යුතු ගිණුම්

ඉකුත් වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින විවිධ පුද්ගලයින් හා ආයතන 16 කින් ලැබිය යුතුව තිබූ රු.1,456,170 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර ගණනාවක සිට විවිධ හේතූන් මත අයකර ගත නොහැකිව පැවති හිඟ අත්තිකාරම් මුදල් රු.2,135,397 ක් පොත් වලින් කපා හැරීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) නිර්දේශ කර තිබුණද ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් ලබාදී තිබූ අත්තිකාරම් මුදල් රු.194,437 ක් විධිමත් අනුමැතියකින් තොරව පොත්වලින් ලියාහැර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.17,479,479 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.24,710,363 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.7,230,884 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන ආධාර රු.7,670,000 කින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයින් තිදෙනෙකු හා ආයතන දෙකක් විසින් විවිධ හේතූන් මත එකතුව රු. මිලියන 171 ක වන්දි ඉල්ලා නඩු 4 ක්ද, වන්දි මුදල සඳහන් නොවන නඩු 4 ක්ද, සමඟ නඩු 08 ක් අධිකාරියට එරෙහිව අධිකරණවල ගොනුකර තිබුණි.

(ආ) අධිකාරිය විසින් කාර්යාල පරිසනකයක් නැතිවීම හා වංචනිකව ගිවිසුම් වෙනස් කිරීම යන කාරණා යටතේ වන්දි මුදල සඳහන් නොවන නඩු දෙකක් බාහිර පාර්ශවයන්ට එරෙහිව අධිකරණවල ගොනුකර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ දිවිනැඟුම වැඩ සටහන යටතේ අධිකාරියේ බල ප්‍රදේශය තුළ ගෘහස්ථ පවුල් ඒකක 15,000 ක් සංවර්ධනය කිරීමේ ඉලක්කය සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන අනුමත කළද, අධිකාරිය වෙත ලැබී තිබුණේ රුපියල් මිලියන 10.72 පමණක් වන අතර සමස්ථ වියදම රුපියල් මිලියන 14.37 ක් විය. මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාද වීමත්, ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 3.65 ක් උපචිත වීමත් නිසා ඉලක්ක ගත මූල්‍ය ප්‍රගතිය ඉටුවී නොතිබුණි.

(ආ) යථෝක්ත වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රමවේදයන් හා නිර්නායකයන් හඳුන්වාදී අංශ 07 කට එකී වැඩ සටහන් පවරා දී තිබුණි. මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අංශ 07 යටතේ වූ කාර්ය මණ්ඩලය හා දිස්ත්‍රික් කාර්යාල හතරක කාර්ය මණ්ඩලයද ඇතුළත්ව සියළුම කාර්ය මණ්ඩල සඳහා වැටුප්, ගමන් වියදම්, අතිකාල හා ඉන්ධන වෙනුවෙන් පමණක් අධිකාරිය රු. 114,864,346 ක් ගෙවා තිබූ අතර විගණනයේදී පරීක්ෂා කරන ලද අංශ පිළිබඳ වූ නිරීක්ෂණ පහත දැක්වේ.

**(i) වැවිලි හා අධ්‍යාපන අංශය - වැවිලි සංවර්ධනය**

- ❖ ගාල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කවල බුලත් වගාව, තැඹිලි වගාව, තේ වගාව, කිතුල් නිෂ්පාදන සංවර්ධනය, ගම්මිරිස් වගාව,

පුවක් වගාව සහ කුරුඳු වගාව යන ව්‍යාපෘති සඳහා 2013 වර්ෂයේ ඇස්තමේන්තුගත රු.5,890,500 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.801,363 ක මුදලක් පමණක් වැයකර තිබූ අතර වියදමේ ප්‍රතිශතය සියයට 13 ක් තරම් සුළු අගයක් විය. ඒ අනුව ඉලක්කගත මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඉටුවී නොමැති බවද නිරීක්ෂණය විය.

❖ 2013 වර්ෂයේදී මොණරාගල දිස්ත්‍රික්කයේ තැඹිලි පැල 5100 ක් බෙදාදීම, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල අක්කර 201 ක තේ වගා කිරීම සිදුකර නොතිබූ අතර මොණරාගල දිස්ත්‍රික්කයේ පුවක්පැල 37,800 ක් වගා කිරීමේ ඉලක්කයෙන් පැල 9,850 ක් වගාකිරීම පමණක් සිදුකර තිබුණි.

**(ii) කෘෂිකර්ම හා පශු සම්පත් අංශය - කෘෂිකාර්මික සංවර්ධනය**

වාණිජ මට්ටමේ ගෙවතු වගා සංවර්ධනය, ආහාර සුරක්ෂිතතා වැඩ සටහන, බීජ හා පැල සැකසුම් ඒකක ශක්තිමත් කිරීම හා බලගැන්වීම, පවතින ආරක්ෂිත තවාන් ශක්තිමත් කිරීම හා බලගැන්වීම යන සංරචක වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.5,447,000 ක් ප්‍රතිපාදනය කළද වර්ෂය තුළ එම මුදලින් වැයකර තිබුණේ රු.3,107,142 ක් පමණක් වන අතර එය වෙන්කළ මුදලින් සියයට 57 කි. ඒ අනුව කෘෂිකාර්මික සංවර්ධනය සඳහා සැලසුම් කළ පරිදි ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

**(iii) පශු සම්පත් හා ධීවර අංශය - පශු සම්පත් හා ධීවර සංවර්ධනය**

සමාලෝචිත වර්ෂය තුළ ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කවල පශු සම්පත් හා ධීවර සංවර්ධනය සඳහා ව්‍යාපෘති හතරකට වෙන්කළ රු.5,747,500 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අධිකාරියේ ප්‍රගති වාර්තාව අනුව වියදම රු.1,636,525 ක් පමණක් වූ අතර වියදමේ ප්‍රතිශතය සියයට 28 ක් විය. ප්‍රායෝගික දුෂ්කරතා හා ගැටළු සහ මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම මත ඉලක්කගත ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොමැති බව අධිකාරිය විසින් විගණනයට දන්වා තිබුණි.

**(iv) අලෙවි හා සේවා සංවර්ධනය**

අලෙවි හා සේවා සංවර්ධනය යටතේ ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්ක වල වැඩ සටහන් 35 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කළ රු.6,140,000 ක මුදලින් සමාලෝචිත වර්සයේ අවසන් දිනට වැඩ සටහන් දෙකකට වැයකළ මුදල රු.715,128 ක් පමණක් විය. එකී වියදමට අදාල ගෙවීම් වවුචර අනුව අභ්‍යන්තර සේවක මණ්ඩල පුහුණුව සඳහා රු.532,000 ක් වියදම් කර තිබුණද එකී පුහුණුවෙන් අදාල ව්‍යාපෘතියට දායකත්වයක් ලැබී ඇති බව විගණනයේදී තහවුරු නොවීය.

මෙම වැඩ සටහන යටතේ 2013 වර්ෂය තුළ මාතර දිස්ත්‍රික්කයේ අතිරේක නිෂ්පාදන අලෙවිය දිරි ගැන්වීමේ වැඩ සටහන් හතරකට රු.4,017,550 ක් ප්‍රතිපාදනය කළද වර්ෂය තුළ ව්‍යාපෘතිය සඳහා කිසිදු මුදලක් වැයකර නොතිබූ අතර මූල්‍ය හා භෞතික ප්‍රගති ඉලක්ක කිසිවක් ඉටු වී නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කිරලකැලේ ව්‍යාපෘතිය යටතේ සේවය කරනු ලබන සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව විධිමත් පරිදි දායක මුදල් එම අරමුදල වෙත ප්‍රේෂණය නොකිරීම නිසා සමාලෝචිත වසරේදී අධිභාර වශයෙන් රු.148,348 ක මුදලක් එම අරමුදලට ගෙවා තිබුණි.

(ආ) 2002 වර්ෂයේ සිට ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් රු.49,923 ක මුදල සමාලෝචිත වර්සයේ අවසන් දින වන විට නිරවුල් කිරීමට ක්‍රියා කර නොතිබුණි.

**4.3 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරිම**

රජයට අයත් මාතර, වල්ගම පිහිටි අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පිහිටි රූඩ් 02, පර්චස් 17 ක් වූ ඉඩම අධිකාරිය සතු නොවුවද, අධිකාරිය විසින් රු.110,434,073 ක් වැය කර ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල එකී ඉඩමේ ඉදිකර තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඉඩමේ අයිතිය අධිකාරියට ලැබී නොතිබුණි.

**4.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්**

අධිකාරිය සතු රු.1,455,000 ක් වූ වාහනයක් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණි. එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා යටතේ රාජකාරි සඳහා ලබාදී තිබූ මෙම වාහනය සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙනස්වීමේදී ආපසු භාරදිය යුතු වුවද, 2014 නොවැම්බර් 25 දින වන විටද ආපසු භාරදී නොතිබූ අතර ඉහත අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටි කාලය සඳහා රියදුරුට ගෙවන ලද රු.25,466 ක වැටුපද, ආපසු අයකරගෙන නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 287 ක් ද තථ්‍ය සේවක සංඛ්‍යාව 259 ක්ද වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 28 ක් විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත ඉවත් කිරීම**

1996 අංක 18 දරන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත යටතේ සංස්ථාපිත කරන ලද මෙම අධිකාරිය 2014 ජනවාරි 03 දිනැති අංක 1843/47 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් ඉවත් කර ඇති අතර 2014 ජනවාරි 03 දින සිට 2013 අංක 1 දරන දිවි නැඟුම පනත බලාත්මකවීමත් සමඟ දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම 2013 වර්ෂයේ දිවිනැඟුම සංවර්ධන දෙපර්තමේන්තු වැඩ සටහන් අනුව සංශෝධනය කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ සංශෝධනයන් ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයන් මත හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් ප්‍රකාරව සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

2013 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට අනුකූලව ප්‍රතිශෝධනය කර තිබුණි.

**5.4 විගණන කමිටු**

අධිකාරියේ සංයුතිය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වෙනස්වීමට නියමිත බැවින් 2013 වර්ෂයේ ජූලි මස 01 දින රැස්වූ දක්ෂිණ සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත දැක්වෙන තීරණයන් ගෙන තිබුණි.

(අ) අධිකාරිය සතුව පවතින වත්කම් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරීමේදී එම වත්කම් අත්හැරීම වැලැක්වීම සඳහා මෙන්ම එම වත්කම් නිසි පරිදි අදාල දෙපාර්තමේන්තුවට පවරා දීම සඳහා අධිකාරිය සතු සියළුම ඉඩම් පිළිබඳ ලේඛනයක් සකස් කිරීම.

(ආ) අධිකාරිය වෙත පවරා ගැනීමට තීරණය කරන ලද නමුත් පවරා ගැනීම සිදු නොකළ ඉඩම් පිළිබඳ ලේඛනයක් නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන සහ ඉඩම්) විසින් සකස් කර ඉදිරිපත් කළ යුතු බව.

මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉඩම් පිළිබඳව මිනුම් දෙපාර්තමේන්තුවෙන් මානක සැලසුම් පිළියෙල කර පවරා ගැනීමට අදාල ගැසට් පත්‍ර විස්තර, ඔප්පු හා පැවරුම් ලිපි, තක්සේරු අගය යනාදී විස්තර දක්වමින් ලේඛනය පිළියෙල කර නොතිබූ අතර විගණනයට ඉදිරිපත් කල ලේඛනය පිළියෙල කර ඇත්තේ පරිසනකයක සඳහන් තොරතුරු මත බව වාර්තා කර තිබුණි.

(ii) අධිකාරිය විසින් දීර්ඝ කාලීන බදුකර යටතේ බදුගත් පුද්ගලයන් සමඟ ඉඩම් 5 ක් හා ගොඩනැගිලි 03 ක් සම්බන්ධයෙන් අත්සන් කර තිබූ බදු ගිවිසුම් දිවිනැගුම දෙපාර්තමේන්තුවට පැවරීමේදී එකී ගිවිසුම් සංශෝධනය කර පවරාදී නොතිබුණි.

(iii) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ අත්පත් කර ගන්නා ලද අක්කර 1148 ක ප්‍රමාණය සහිත ඉඩම් හයක තැන්පතු නැවත අධිකාරියට පවරා ගෙන ඉඩම් අත්පත් කරගැනීම අත්හැර දමා ඇති බව දක්වා ඇති අතර එකී ඉඩම් ආපසු පවරා දීම සම්බන්ධ තොරතුරු නොවීය.

(iv) අධිකාරියේ පනතේ 17 වගන්තියේ බලතල පරිදි හා 1997 ජුනි 17 දිනැති අංක 980/22 දරන ගැසට් පත්‍රයෙන් මාතර දිස්ත්‍රික්කයේ අක්කර 90 ක ප්‍රමාණයක ඉඩම් හතරක් පවරා ගැනීමට ප්‍රසිද්ධ කර ඇතත් එකී ඉඩම් පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කර එම ඉඩම් පවරා ගෙන නොතිබූ අතර පවරා ගැනීමට නිකුත් කළ ගැසට් පත්‍රය අවලංගු කිරීම හෝ සිදුව නොතිබුණි.

**5.5 නොවිසඳී ඇති විගණන ඡේද**

නොවිසිඳී ඇති විගණන ඡේද පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තම්මැන්නාව වැව් බැම්මට බොරලු පස් ඝන මීටර් 4336 ක් යෙදීම සඳහා රු.2,065,706 ක මුදලක් ගෙවීම**

මේ සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) තිස්සමහාරාම වාරිමාර්ග ඉංජිනේරුවරයාගේ 2014 ජනවාරි 22 දිනැති වාර්තාව පරිදි වැව් බැම්මේ ස්ථාන හතරකින් ලබාගත් පස් සාම්පල අනුව ඝණවත්කරන ලද පස් ප්‍රමාණය පස් ඝන මීටර් 3114 ක් බවත්, ජලයෙන් පිරී පැවති කොටසේ පස් ප්‍රමාණය ගණනය කළ නොහැකි බවත්, සමස්ථ පස් ප්‍රමාණය පස් ඝනමීටර් 4203.9 ක් බවත්, වාර්තා කර තිබූ අතර ඒ අනුව නිවැරදි පස් ප්‍රමාණය එකී වාර්තාවෙන්ද තහවුරු කර නොතිබුණි.

(ii) වැව් බැම්ම සඳහා යෙදූ පස් ප්‍රමාණය ගණනය කිරීමේදී බැම්මේ දිග, පළල ප්‍රමාණ සළකා බලා නොතිබූ අතර මිණුම් පත්‍ර අනුව පස්වල ධාරිතාවය ගණනය කර තිබුණේ පස් මුට්ට කර යොදවන ලද පස් ප්‍රමාණය ගණනය කිරීමෙනි. එහෙයින් ගෙවීම් කළ පස් ප්‍රමාණය වැව් බැම්මට යෙදවූයේද යන්න තහවුරු නොවේ.

(iii) මේ සම්බන්ධව 2013 දෙසැම්බර් 19 වන දින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ තීරණය පරිදි අදාල නිලධාරීන්ගෙන් නිදහසට කරුණු විමසීම හැරුණුවිට මේ පිළිබඳව වැඩිදුර පරීක්ෂාවක් සිදුවී නැත.

**(ආ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබාදී තිබෙන නියෝග ඉටු නොකිරීම**

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් 2012 ඔක්තෝබර් 16 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම ආයතනයේ සංයුතිය ඉදිරියේදී වෙනස්වීමට (දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව) නියමිත හෙයින් එදිනට සාකච්ඡා කිරීමට නියමිතව තිබූ කරුණු 17 ක් සඳහා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග හා තවදුරටත් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව කටයුතු කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරන ලදී. ඒ අනුව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 7 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාවක් 2013 අප්‍රේල් 19 දින විගණකාධිපති වෙත පිටපත් සහිතව රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා ලේකම්වරයා වෙත යොමුකර තිබුණි. එම කරුණු 17 න් පහත දැක්වෙන කරුණු 07 ක් 2013 දෙසැම්බර් 31 දිනටද විසඳී නොතිබුණි.

(i) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග අංක 6 මගින් ඕස්ට්‍රේලියානු සමාගමකින් ගිවිසුම පරිදි ලැබිය යුතු රු.දශ ලක්ෂ 36.4 ක මුදල අයකර ගැනීමට වගකිව යුතු අයට එරෙහිව අල්ලස් හා දූෂණ කොමිසම වෙත පැමිණිලි කිරීමට නියම කර ඇති අතර අධිකාරිය ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග අනුව අයවිය යුතු රාජ්‍ය භාගය අයකර ගෙන නොතිබුණි.

(ii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග අංක 8 මගින් කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව පෞද්ගලික මූල්‍ය ආයතනයක ආයෝජනය කර තිබූ රු.දශලක්ෂ 43.888 ක් ආපසු අයකර ගැනීමට නියම කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ නියමය මත සමාගම විසුරුවා හැර, එකී සමාගම සතුව තිබූ වාහන දෙකක් ඉඩම හා ගොඩනැගිල්ල රජයේ පොදු තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම වූ

රු.14,900,000 කට අධිකාරියට පවරාගෙන තිබුණි. එහෙත් අධිකාරිය යොදවන ලද රු.10,000,000 ක ආරම්භක ප්‍රාග්ධනය හා රු.18,172,520 ක මුදල සමඟ එකතුව රු.28,172,520 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අයකරගෙන නොතිබුණි.

(iii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග අංක 8 මඟින් කිරලකැලේ ව්‍යාපෘතිය සඳහා අයිතිය ලබානොගෙන රු.7,113,104 ක වියදම් දැරීම පිළිබඳව කටයුතු කළ සියළුම පුද්ගලයින්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නා ලෙසට නියම කර ඇති අතර ව්‍යාපෘතියේ කටයුතු පවරා දුන් ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය කිසිදු කටයුත්තක් ආරම්භ කර නොතිබුණි.

(iv) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග අංක 9 මඟින් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා විවිධ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තැන්පත් කළ රු.13,607,115 ක මුදල පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට නියම කර ඇත. 2013 දෙසැම්බර් 31 දිනට රු. 1,947,127 ක මුදලක් හිඟ හිට තිබුණි.

(v) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග අංක 13 මඟින් නිල්වලා ගඟ යකඩ පාරුව සම්බන්ධයෙන් වාරිමාර්ග අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර තීරණයක් ගෙන කමිටුවට වාර්තා කරන ලෙසට නියම කර තිබුණි. එහෙත් යකඩ පාරුව සම්බන්ධ බදු ගිවිසුම අත්සන් කළ ආයතනය අධිකාරියට එරෙහිව රු. මිලියන 158 ක වන්දි ඉල්ලා නඩු පවරා තිබුණි.

(vi) සේවයෙන් ඉවත්වූ සම්බන්ධීකරණ නිලධාරියාගේ වාහනයට වැයකළ රු.450,725 ක මුදල එම නිලධාරියාගෙන් අයකර ගන්නා ලෙසට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග අංක 14 අනුව නියම කර ඇතත් එකී මුදල අයකරගෙන නොතිබුණි.

(vii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග අංක 15 ප්‍රකාර ගාල්ල අක්මීමන, කඳුරුදූවවත්ත අක්කර 19 රූඩ් 02 පර්.14 ක් පවරාගෙන රු.10,539,989 ක මුදලක් වැයකර ඇතත් සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් වියදම නිෂ්ඵල වීම නිසා ගිවිසුම් පරිදි කටයුතු නොකළ ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගැනීමට නියෝග කර ඇත. මෙම ඉඩම පවරා ගැනීමේ ප්‍රමාදය නිසා රු.6,675,994 ක පොළී ගෙවීමට සිදුවීම, 1997 වර්ෂයේ රු.3,000,000 ක තක්සේරුව පිළිගෙන තිබියදී 2006 වර්ෂයේදී රු.10,539,989 ක් ගෙවීම, හිමිකම්පාන්නන් හඳුනා නොගැනීම යනාදිය සිදුව නොතිබුණි. එසේ වුවද 2012 දෙසැම්බර් 07 දිනැති ලිපියෙන් ජනාධිපතිතුමා විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ පාසලකට මෙම ඉඩම පවරා දී ඇතත් කිසිදු සංවර්ධන කටයුත්තක් ආරම්භ කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂනය වූ පද්ධති හා පාලන දූර්වලතා වරින්වර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අවධානයට යොමු කරන ලද පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අයවැය පාලනය

(ආ) සැලසුම් සකස් කිරීම

(ඇ) ලේඛන පැවැත්වීම

(ඈ) ස්ථාවර වත්කම් පාලනය